**අකුරණ ප්‍රාදේශීය සභාව - 2021**
**-------------------------------------**

1. මූල්‍ය ප්‍රකාශන
-------------------

1.1 තත්ත්වාගණනය කළ මතය
---------------------------------

අකුරණ ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට අකුරණ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-------------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
-----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතී,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැඩ නිම නොකළ වටිනාකම රු.855,000 ක්වූ කර්මාන්ත 03ක් කර්මාන්ත ණය හිමි හා ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් එම ප්‍රමාණයේ ප්‍රාග්ධන වියදම් හා කර්මාන්ත ණයහිමියෝ මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි. | මෙය මහජන ඉල්ලීම මත ඉටු කිරීමට අත්‍යවශ්‍ය වූ බැවින් ණය හිමි ලෙස සටහන් කර ඇති අතර මේ වන විට ගිවිසුම් ගතවී ඇති බව දන්වා ඇත. | වැඩ නිමකර තාක්ෂණික නිලධාරී කළ වැඩ වාර්තා අනුව නිමි වටිනාකම පමණක් ණයහිමි ලෙස ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොමැති වීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.23,853,904 ක වත්කම් විෂයයන් 03 ක් ස්ථාවර වත්කම් ලේඛනය සහ උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | ස්ථාවර වත්කම් ලේඛනය සහ උපලේඛන විගණනය සඳහා ඉදිරිපත් කළ බව දන්වා ඇත. | නියමිත ආකෘති ප්‍රකාරව පිළියෙල කළ උපයෝගී ලේඛන සමඟ විගණනයට අදාළ සියලු තොරතුරු ඉදිරිපත් කළ යුතුය. |

1.7 අනුකූල නොවීම්

නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| 1978 අංක 41 දරන නාගරික සංවර්ධන පනත | හෙක්ටයාර 01 ට වැඩි ඉඩමක් වාණිජ කටයුත්තක් වෙනුවෙන් කට්ටි කර විකිණීමේදී එම ඉඩමේ මුළු ප්‍රමාණයෙන් සියයට 10 ක ප්‍රමාණයක් පොදු කටයුතු උදෙසා වෙන්කර එහි පාලනය අදාළ ප්‍රාදේශීය පළාත් පාලන ආයතනයට පවරා දිය යුතු වුවද. අකුරණ සහ බල ප්‍රදේශයේ කට්ටි කර විකුණන ලද අක්කර 25 රූඩ් 02 පර්චස් 29 ක ඉඩම් කොටස් දෙකක් සම්බන්ධයෙන් සභාවට පවරා ගතයුතු ඉඩම් කොටස් සභාවට පවරාගෙන නොතිබුණි. | මෙම ඉඩම කොටස් කිරීම සභාවේ අනුමැතිය මත සිදු කරන ලෙසත් එසේ නොවන්නේ නම් නීති මඟින් කටයුතු කරන බවත් හිමිකරු වෙත දන්වා ඇති අතර ඉඩමෙහි දැන්වීමක් ද පළකර ඇති බව දන්වා ඇත. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.33,400,644 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.23,626,331 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට වරිපනම් හා බදු හිඟ මුදල් රු.1,700,204 ක් වූ අතර වර්ෂය තුළ එම ශේෂයෙන් රු.517,064 ක් හෙවත් සියයට 30 ක් | 2022 මැයි 31 දින වන විට මෙම හිඟ මුදලෙන් රු.1,083,179 ක මුදලක් අයවී ඇත. | පනතේ විධි විධාන ප්‍රකාරව හිඟ මුදල් අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පමණක් අයකරගෙන තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂයේ වරිපනම් හා බදු බිල් කිරීම රු.7,912,202 ක් වූ අතර වර්ෂය තුළ බිල් කිරීමෙන් රු.5,754,704 ක් හෙවත් සියයට 73 ක් පමණක් අයකරගෙන තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.3,506,355 ක හිඟ මුදල් අයවිය යුතුව තිබුණු අතර එම හිඟ ශේෂ අයකර ගැනීමට ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | වරිපනම් දේපල වර්ෂ 05 කට වරක් තක්සේරු කළ යුතු වුවද 2012 වර්ෂයෙන් පසු වරිපනම් දේපල තක්සේරු කර නොතිබුණි. | මේ පිළිබඳව අවස්ථා ගණනකදීම තක්සේරු දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇත. | දේපල තක්සේරුව නියමිත දිනට සිදු කළ යුතුය. |
| (ඇ) | ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇති හෝටල්වල වාර්ෂික ආදායමෙන් සියයට 1 නොඉක්මවන ආදායමක් අයකර ගත යුතු වුවද, අකුරණ සභා බල ප්‍රදේශය තුල පවත්වාගෙන යනු ලබන ලියාපදිංචි හෝටල් 2 ක ආදායම තහවුරු කර ගැනීමකින් තොරව රු.215,873 ක ආදායමක් පමණක් අයකරගෙන තිබුණි. | අදාළ ආයතනවල ගිණුම් වාර්තා සනාථ කරදෙන ලෙස සංචාරක මණ්ඩලයට දන්වා ඇතත් බාහිර පාර්ශවයන්ට ඒවා ලබාදීමට නොහැකි බව පවසා ඇති බවත් 2021 ගිණුම් වාර්තා ලබාදෙන ලෙස අදාළ ආයතන දැනුවත් කර ඇති බවත් දන්වා ඇත. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

3. මෙහෙයුම් සමාලෝචනය
-------------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

3.1 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
----------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කසළ අපහරණය සඳහා අක්කර 5 රූඩ් 2 පර්චස් 22.5 ක ඉඩමක් 2003 ජූලි 26 දින රු.525,000 ක් වැයකර මිලදී ගෙන තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද එම භූමිය කසළ අපහරණය සඳහා විධිමත් පරිදි උපයෝජනය කර නොතිබුණි. | 2021 වර්ෂයේ සභා අරමුදලින් හා පළාත් සභා අරමුදලෙන් කොම්පෝස්ට් අංගනයේ ඉදිකිරීම් කටයුතු සිදු වෙමින් පවතින බවත් දිරන කසළ උකුවෙල ප්‍රාදේශීය සභාව වෙත යැවීමට කටයුතු කරමින් පවතින බවත් දන්වා ඇත. | භූමිය විධිමත් පරිදි කසළ අපහරණය සඳහා සකස් කළ යුතුය. |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පොදු අරමුදල් යටතේ අකුරණ ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක කිරීම සඳහා රු.5,500,000 ක් වටිනා ව්‍යාපෘති 49 ක් සම්බන්ධයෙන් ගිවිසුම් අත්සන් කිරීම හෝ ඇස්තමේන්තු සකස් කිරීම පමණක් සීමාවී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වැනි දින වන විට එම ව්‍යාපෘති නිම කිරීමට කටයුතු කර නොතිබුණි. | ව්‍යාපෘති නිම කිරීමට අදාළ කටයුතු සිදු කරමින් පවතින බව දන්වා ඇත. | සැළසුම් කළ ව්‍යාපෘති නිම කළ යුතුය. |